වසමේ නම : 787 සී, තොටහ ග්‍රාම නිලධාරි වසම

වසම පිළිබඳ හැඳින්වීම : කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 60 අතරින් 787-සී තොටහ ග්‍රාම නිලධාරි වසම

උතුරට - 787 - ඒ කටුදොර වසමෙන් ද
නැගෙනහිරින් - 787- බී වලල්ලාවිට දකුණ වසමද
දකුණෙන් - පැලවත්ත ගඟගෙන්ද
බටහිරින් - 787 ගයිරල වසමෙන් ද

මායිම්ව පිහිටා ඇති අතර හෙක්ටයාර් 383 ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්තය. එසේම මෙහි ප්‍රධාන ගම් වශයෙන්

බෝපිටිය
තොටහ
ගුණැනිය
වන්නිමුල්ල.

හැඳින්විය හැකිය.

මෙම වසමේ ජනගහනය 890 ක් පමණ ජීවත් වෙන අතර ඔවුන් සිංහල බෞද්ධයෝ වෙති. බොහෝ විට මෙම ජනතාව පොදු පහසුකම් අවම කෘෂි කර්මාන්ත ජීවනෝපාය කරගත් ශක්ති සම්පන්න ශ්‍රම බලකායකින් යුක්තය.

මෙම වසමට අයත් භූමි ප්‍රදේශයට වසර මුළුල්ලේ වර්ෂාපතනය ලැබෙන අතර සාමාන්‍ය උෂ්ණත්වකින් යුක්ත බැවින් යහපත් දේශගුණික තත්ත්වයක් පවති. එසේම මෙම වසමේ පහත් බිම් සහිත ගම්මාන කිහිපයක් නිතර ගංවතුර ආපදාවන්ට ගොදුරු වෙනු ඇත.

එසේම මෙම ග්‍රාම නිලධාරි වසමට අයත් වන පැණියාවල රක්ෂිතය සහ කොටස් ඇල්ල පාරිසරික වශයෙන් මෙන්ම ස්වාභාවික වශයෙන් වැදගත් වන අතර දෙයියාගල ආරණ්‍ය ඓතිහාසික වශයෙන් සහ ආගමික වශයෙන් වැදගත් වෙනු ඇත. එබැවින්,


i පැණියාවල රක්ෂිතය
ii තොටස් ඇල්ල
iii දෙයියාගල ආරණ්‍ය

යන ස්ථාන කිහිපයම වර්තමානයේ සංචාරකමය ස්ථානයන් බවට පත්ව ඇත.

වසමට පිවිසෙන ගමන් මාර්ගය

කළුතර ප්‍රධාන නගරයේ සිට කළුතර ගාලු මාර්ගයේ පැමිණ කටුකුරුන්දෙන් වමට හැරී පැමිණ සෙන්ටල් හන්දියෙන් දකුණට හැරී මතුගම නගරයට පැමිණ දකුණට හැරී මතුගම අළුත්ගම මාර්ගයෙන් පැමිණ හොරවල හන්දියෙන් දකුණට හැරී මීගහතැන්න නගරය දක්වා පැමිණ දකුණට හැරී වලල්ලාවිට මාර්ගයේ පැමිණ වලල්ලාවිට හන්දිය පසු කළ පසු වල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හමු වේ. එය පසු කරමින් කිලෝ මීටර් 1 ක් පමණ දුර ගිය විට 787 සී, තොටහ ග්‍රාම නිලධාරී වසම හමු වේ.

දළ සටහන



වසමේ නම හැඳුන ආකාරය

මෙම ග්‍රාම නිලධාරි වසමට අයත් ප්‍රාදේශයෙහි විශාල තොටුපලක් පිහිටා තිබී ඇති බැවින් එම තොටුපලෙන් නිතර එගොඩ මෙගොඩ ගමන් කිරිමට ප්‍රදේශවාසින්ට සිදු වී ඇත. මේ සඳහා ඔවුන් ඔරු පාරු භාවිතා කර ගනිමින් තොටුපලහි එගොඩ මෙගොඩ ගමන් කරන්නට විය. එවිට එම ස්ථානය ගමන් මාර්ගයක් වූ බැවින් එගොඩ මෙගොඩ කරන්නට විය. එවිට එම ස්ථානය ගමන් මාර්ගයක් වු බැවින් එගොඩ මෙගොඩ හා වීම නිසා ''තොට හා'' නමින් භාවිතා වන්නට ඇති බවත් එය වර්තමානයේ '' තොටහ'' වූ බවත් ප්‍රදේශවාසීන්ගේ මතයයි.

මේ සඳහා තවත් මතයක් නම් පැණියාවල රක්ෂිතයෙන් ආරම්භය වූ ඇළ මාර්ගය මෙම ප්‍රදේශය හරහා ඇවිත් තොටුපල පිහිටි ස්ථානයෙන් ගඟට එක්වීම නිසා තොට හා වූ බැවින් ''තොටහා'' වී පසුව''තොටහ'' වූ බවත්ය.

වසමේ භූමියේ ස්වභාවය

මෙම ග්‍රාම නිලධාරි වසමට අයත් භූමි ප්‍රදේශය උස් කඳු බිම් හා පහත් බිම් වශයෙන් පිහිටා ඇත. උස් කඳු ප්‍රදේශවල ලදු කැලෑ විශාල ගස් වර්ග සහ විශාල ගල් පිහිටා ඇත. එසේම පහත් භූමි ප්‍රදේශයේ (ගුණෑනිය ප්‍රදේශයේ) වැලි තොටුපලවල් පිහිටීම තවත් විශේෂ ලක්ෂණයකි.

ස්වාභාවික පරිසරයේ සුන්දර ස්ථාන

01. පැණියාවල රක්ෂිතය

02. කොටස් ඇල්ල

01. පැණියාවල රක්ෂිතය

අක්කර 9900 කින් යුක්ත පැණියාවල වන රක්ෂිතයෙන් මෙම ග්‍රාම වසට අක්කර 395 ක භූමි ප්‍රමාණයක් අයත්ව ඇත. මෙහි ජීවත්වෙන වන සතුන් සහ පක්ෂීන් වර්ග සහ දුර්ලභ ගණයේ විශාල ගස්වැල් ආදියත් විශාල ගල් පිහිටා ඇති ආකාරයත් මෙම රක්ෂිතයේ ඇති සුන්දරත්වය විදහාපාන්නෙකි. එසේම සුන්දර ගල්තලාවක් මත දෙයියාගල ආරණ්‍ය සේනාසනය පිහිටා ඇති අයුරුත් එම පහලින් ගලා එන නොටස් ඇළ පිහිටා ඇති ආකාරයත් ඉතාමත් දර්ශනීයයි.



02. තොටස් ඇල්ල

පැණියාවල වන රක්ෂිතයෙන් ආරම්භ වී දෙයියාගල ආරණ්‍ය සේනාසනය අභියසින් පහළට ගලා බසින තොටස් ඇල තවත් මීටර් 300 ක් පමණ පහළට ගලා එත්ම තොටස් ඇල්ල පිහිටා ඇත. වර්ෂ කාලයේ දී අඩි 20 ක් පමන උසට ගලා බසිති. මේ දිය ඇල්ල පාමුල සුන්දර ගල් තලාවක් පිහිටා ඇත. ඒ මතින් පහළට ගලා බසින තොටස් ඇලෙහි නාන තොටුපල පිහිටා ඇත. මෙම ස්ථානයට ඇත ප්‍රදේශවලින් පැමිණ තොටස් ඇලේ සිසිලස විඳ විනෝද වෙන සංචාරකමය ස්ථානයක් බවට පත් වී ඇත.



ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන

මෙම වසමට අයත් දෙයියාගල ආරණ්‍ය සේනාසනය පිහිටි ස්ථානය ඓතිහාසික වශයෙන් වැදගත් වෙනු ඇත. එය පිහිටා ඇත්තේ සුන්දර ගල්තලාවකය විශාල ගලක් මත ගල් ලෙන් තුල ධාතු මන්දිරය සහ විහාර මන්දිරය පිහිටා ඇත. ඒ පාමුලින් කොටස් ඇල සෙමින් පහලට ගලා බසී. මෙම විශ්මිත ගල් ලෙන් තලාවට ඉහළින් ගලක පිහිටි සෙල්ලිපියෙන් ද අණාවරණය වන්නේ මෙම් ස්ථානයේ ඓතිහාසිකත්වයයි. එසේම මෙම ස්ථානයේ වීදිය බණ්ඩාර කුමාරයා සටනින් පරාජයට පත් වී පළා ඇවිත් සැඟ වී සිටි බවට සාක්ෂි තිබෙන බවත් ජනප්‍රවාද සඳහන් කරයි.






- පොලිස් ස්ථාන : නැත
- තැපැල් කාර්යාල : නැත.
- වෛද්‍ය මධ්‍යස්ථාන : නැත.
- ලියාපදිංචි නවාතැන් : නැත.

ප්‍රාදේශීය බෝග වගාවන් පිළිබඳ විස්තර

මෙම වසමේ තේ, රබර්, පොල් යන ප්‍රධාන බෝග වගාවන් සහ කුරුඳු, මිශ බෝග, ගොවතු වගා ආදි බෝග වගාවන් ද වගා කරනු ඇත. මෙම ප්‍රදේශයන්හි ජනතාව බහුල වශයෙන් වී ගොවිතැනට මූලිකත්ව දීම ප්‍රධාන ලක්ෂණයකි.



වසමේ සාම්ප්‍රදායික කර්මාන්ත සහ ලියාපදිංචි ව්‍යාපාර

01. සාම්ප්‍රදායික කර්මාන්ත

i කිතුල් කර්මාන්තය

ii ඉදල් කර්මාන්තය

ලියාපදිංචි ව්‍යාපාර

i බිම් මල් නිෂ්පාදනය

ii කුළු බඩු පැකට් කිරීම.

iii හඳුන්කුරු නිෂ්පාදනය

iv වාහන අලුත්වැඩියා කිරීම.

v බ්ලොක් ගල් කැපීම.

vi පැස්සුම් කර්මාන්තය

vii රස කැවිලි නිෂ්පාදනය

ix තේ දළු මිල දී ගැනීම.

x විදුලි කාර්මික